# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## දෙවන වාර පරීක්ෂණය - 2013

## නර්තනය

කාලය - පැය 2 යි

## 7 ශ්‍රේණිය

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

නම : ........................................................................ පන්තිය : .........................

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. උඩරට නර්තනයේදී මිටිරියනක් යන්න භාවිතා කෙරෙනුයේ කුමන අවස්ථාවකදී ද?
   - I ගැටබෙරයේ බෙරකඳේ දිග ගණනය කිරීමේදී
   - II මණ්ඩියට පහත්වීමේදී දැත් තබා ගත යුතු දුර ප්‍රමාණයයි.
   - III අංග චලනයේදී දැත් හැසිරවිය යුතු දුර ප්‍රමාණයයි.
   - IV මණ්ඩියට පහත්වීමේදී දෙපා විලුඹ අතර දුර ප්‍රමාණයයි.

02. එකැස් බෙරය යනුවෙන් හැඳින්වෙනුයේ
   - I පහතරට බෙරයයි. II දවුලයි. III රබානයි. .IV බුම්මැඩියයි.

03. මාත්‍රා 2 +3 දෙතිතට නර්තනය කළ හැකි අඩව්වක පද කොටසකි.
   - I තත් තොහ තක තොහ තක්කඩ තරිකිට තක තොහ........
   - II තත් තකට තක රොං තක්කඩ තක්කඩ කුද කත රොං...........
   - III තාම් දොම්ති ගත දොම්කිට කඩතක තරිකිට.............
   - IV රුද ගජිත රුද ගජිත රුද ගජිත රුද තා........................

04. උඩරට නර්තන සම්ප්‍රදායේදී ගොඩ සරඹ ලෙස හඳුන්වන අත්සරඹ පහතරට නර්තන සම්ප්‍රදායේදී හඳුන්වනු ලබන්නේ.
   - I ඉලංගම් සරඹ යනුවෙනි. II මාත්‍රා පද යනුවෙනි.
   - III දොඹින පද යනුවෙනි . IV අත් සරඹ යනුවෙනි.

05. බණ්ඩාරදෙවි හත්කට්ටුව සහ කොහොඹා දෙවි තුන්කට්ටුව ප්‍රධාන දෙවිවරු ලෙස පුද ලබන ශාන්ති කර්මය ඇතුලත් නර්තන සම්ප්‍රදාය වන්නේමින් කුමක්ද?
   - I පහතරට නර්තන සම්ප්‍රදාය II සබරගමු නර්තන සම්ප්‍රදාය
   - III උඩරට නර්තන සම්ප්‍රදාය IV උඩරට සහ පහතරට නර්තන සම්ප්‍රදාය

06. නර්තන මාධ්‍යයෙන් සත්ව චරිතයක් නිරූපණය කිරීමේදී වඩාත්ම අවධානය යොමු කළයුතු නිවැරදි පිළිතුර වන්නේ,
   - I තාලය,රිද්මය හා අභිචලනය II තාලය, හැසිරීම විලාශය හා හඬ
   - III අභිචලනය, ගමන, තාලය IV මෙ කිසිවක් ඇතුලත් නොවේ.

07. වන්නමක මාත්‍රා නටා අවසානයේදී නටනු ලබන පද කොටස් පිළිවෙලින් මෙසේය.
   - I සීරුමාරුව,කස්තිරම,අඩව්ව II කස්තිරම,සීරුමාරුව,අඩව්ව
   - III අඩව්ව.සීරුමාරුව,කස්තිරම IV කස්තිරම,අඩව්ව, සීරුමාරුව

08. පහන් මඩුව සහ දෙවොල් මඩුව යන ශාන්තිකර්ම අයත්වන නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් මෙසේය.

I උඩරට සහ පහතරට නර්තන සම්ප්‍රදාය II පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදාය

III සබරගමු සහ උඩරට නර්තන සම්ප්‍රදාය IV සබරගමු සහ පහතරට නර්තන සම්ප්‍රදාය

09. විශේෂයෙන් ගිනි පෑගීමේ චාරිත්‍රය දක්නට ලැබෙන පෙරහැර මින් කුමක්ද?

I රත්නපුර සුමන සමන් දේවාල පෙරහැර II දෙවින්දර හා කතරගම දේවාල පෙරහැර

III මහනුවර දළදා පෙරහැර IV නවගමු දේවාල පෙරහැර

10. තුරඟා වන්නමෙහි බෙරපදය කුමක්ද?

I දොං ජිංත ගත දොංත II කුඳ ගත ගත දොම්

III ජිං ගත ගොගො IV ජිං කඩ තක ජිං කුකු තක

11. රබන් පද වාදනය පිළිබඳව වඩාත් නිවැරදි අදහස මින් කුමක්ද?

I සංවාදාත්මක ස්වරූපයෙන් රබන්පද වාදනය කළහැකි වේ.

II සාමූහිකව රබන්පද වාදනයේදී අන්‍යෝන්‍ය සුහදතා වර්ධනයක් සිදුනොවේ.

III රබන් පද වාදනය සඳහා අත්රබාන භාවිතා කරයි.

IV අත්රබාන භාවිතා කරමින් විරිඳු ගායනා කරයි.

12. සුරපුර දෙවියන් රකුමෙසියල්ලා................යන කවි පදය අයත්වන කවි විශේෂය මින් කුමක්ද?

i කුළු කවි පදයකි II ලී කෙළි කවි පදයකි

III ඔංචිලිවාරම් කවි පදයකි IV රබන් පදයකි

13. මාත්‍රා 2 +3 තාලරූපය හඳුන්වන්නේ කුමන තාල රූපය ලෙසින්ද?

I සුළු මැදුම් තනිතිතේ තාලරූපය II මැදුම් මහ දෙතිත තාලරූපය

III සුළු මැදුම් දෙතිතේ තාලරූපය IV මැදුම් මහ දෙතිතේ තාලරූපය

14. දේශීය ජන ක්‍රීඩා ලෙස අප හඳුන්වන්නේ,

I එළුවන් කෑම, ඔළිඳ කෙළිය, ලීකෙළිය II ඔළිඳ කෙළිය,කුලු, කළ

III අංකෙළිය, පතුරු, කඩු IV පනා හැංගීම, එළුවන් කෑම, මේවර කෙළිය

15. තම්මැට්ටම හැඳින්වීම සඳහා භාවිතා කරන තවත් නමකි.

I රුහුණු බෙරය II එකැස්බෙරය III පොකුරු බෙරය IV සෝෂක බෙරය

16. නර්තනයකදී අවකාශ භාවිතය පිළිබඳව නිවැරදි පිළිතුර මින් කුමක්ද?

I පුද්ගල අවකාශ ගණනාවකින් පොදු අවකාශය සමන්විතවේ.

II අවකාශ භාවිතය කොටස් 04 කින් සමන්විත වේ.

III ස්ථිතික සහ සංචාරි ලෙසින් අවකාශය කොටස් දෙකකින් සමන්විත වේ

.IV අවකාශ භාවිතය කොටස් 05 කින් සමන්විත වේ.

17. අස්නය හා ආවැන්දුම කුමන ශාන්තිකර්මයක් තුළ එන නර්තන අංගයක් ද?

I පහන්මඩුව ශාන්ති කර්මය II කොහොඹා කංකාරි ශාන්තිකර්මය

III දෙවොල්මඩු ශාන්තිකර්මය IV පූනා මඩු ශාන්තිකර්මය

18. මහනුවර ඇසළ පෙරහැරේ දක්නට ලැබෙන සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

I මද්දලය,උඩැක්කිය II අත්රබාන,තාලම්පට

III ඩොල්කිය, තාලම්පට IV සිම්බල්, ගැටබෙරය

19. සත්ව සම්වලින් සාදාගන්නා ලද වාද්‍ය භාණ්ඩ හැඳින්වීම සඳහාමෙම නම භාවිතා කරයි.

| | | | |
|---|---|---|---|
| I | පංච තූර්ය වාද්‍ය භාණ්ඩ | II | අවනද්ධ වාද්‍ය භාණ්ඩ |
| III | තත් වාද්‍ය භාණ්ඩ | IV | ආදේශ භාණ්ඩ |

20. ගැමි නැටුම් පිළිබඳව වඩාත් නිවැරදි අදහස දැක්වෙන පිළිතුර මින් කුමක්ද?

I සරල බව හා සාම්ප්‍රදායික ලක්ෂණ දක්නට ලැබේ.

II ශාස්ත්‍රීය බව හා වාම් බවක් දක්නට ලැබේ.

III සරල කවි සහ සරල ඇඳුම් පැළඳුම් භාවිතා කරයි.

IV සාම්ප්‍රදායික ලක්ෂණ සහ ආදේශ භාණ්ඩ භාවිතා කරයි.

(ලකුණු 2x20 =40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1.

I. හතරවන පාසරඹයේ පදය.........................................................වේ. (ල.1)

II. මහ රබානට කියන තවත් නමකි......................................................... (ල.1)

III. ගැටබෙරයක සාමාන්‍ය දිග ප්‍රමාණය..............................................වේ. (ල.1)

IV. හතරවන ගොඩසරඹයේ කස්තිරම....................................................................
.............................................................................................................වේ (ල.1)

V. පත්තිනි දේවිය ප්‍රධාන දෙවියන් ලෙස සැලකෙන ශාන්ති කර්මයකි ............
............................................................................................................ (ල.1)

VI. රූපවාහිනි ළමා නර්තන ඇතුලත් වැඩසටහනකි....................................... (ල.1)

VII. දකුණු ප්‍රදේශයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය............................................ (ල.1)

VIII. මොර හිඹුටු දම් පනා අඹ දඹද ඇටඹිනා යන්නෙහි තාල රූපය වන්නේ .......
...........................................................................................තාලයකි (ල.1)

IX. චලන ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්
1. ..............................................................
2. .............................................................. (ල.2)

X. කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දැකියහැකි සැරසිල්ලක් සහ සාදන මඩුවේ දිග, පළල සඳහන් කරන්න.
1. සැරසිල්ල...........................................................
2. දිග................................පළල........................... (ල.2)

2 අප නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයේ ප්‍රධාන ශාන්තිකර්මයන් සිදුකිරීමේ මූලික අරමුණු බොහෝමයක් සමානකම් දක්වයි.

I. එම අරමුණු තුනක් ලියන්න. (ල. 3)

II. ශාන්තිකර්මයන් තුනටම පොදුවූ චාරිත්‍ර තුනක් ලියන්න. (ල.4)

III. කොහොඹාකංකාරියේ උපත්කතාව කෙටියෙන් විස්තර කරන්න (ල.5)

3

I. දෙතිතේ තාල ප්‍රභේද ලියා දක්වන්න. (ල. 3)

II. මාත්‍රා 2 තාලයට අයත් බෙර පදයක් හ කස්තිරමක් ලියන්න (ල. 4)

III. තුරඟා වන්නමේ බෙරපදය, තානම හා කවියක් ලියන්න. (ල. 5)

4

I. ජුලි මාසයේ සිදුකෙරෙන පෙරහැර තුනක් නම් කරන්න. (ල. 3)

II. එක් පෙරහැරක පැවති සම්ප්‍රදායික නර්තනාංග 4 ක් නම්කර ඊට අදාල සම්ප්‍රදායන් ලියන්න. (ල.4)

III. මහනුවර දළදා පෙරහැර පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල.5)

5

I. ගැමි නැටුම්වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ හතරක් නම් කරන්න. (ල.4)

II. ලී කෙළි කවියක් හා කුලු කවියක් ලියන්න. (ල. 4

III. කුලු නැටුමක් නිර්මානය කිරීමේදී සැලකිලිමත් වියයුතු කරුණු හතරක් ලියන්න (ල. 4)

6

I. සුළු තනි තිතට හා මැදුම් තනි තිතට බෙරපදය බැගින් ප්‍රස්තාර කරන්න. (ල.6)

II. රුපවාහිනී ළමා නර්තන වැඩසටහනක ඔබ සිත්ගත් නර්තනාංගයක්පිළිබඳ ගායනය, වාදනය, නර්තනය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ සැලකිලිමත් වෙමින් සාකච්ඡා කරන්න. (ල.6)

7 පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

i අවකාශය භාවිතය

ii ගොඩසරඹ

iii සාම්ප්‍රදායික භාණ්ඩ හා ආදේශ භාණ්ඩ

iv ලී කෙළි නැටුම

v ඔන්චිලි වාරම් කවි (4 x3 = 12)